# කබීර්දාස්ගේ 'සාඛී' - හි අන්තර්ගත බෞද්ධ දර්ශනය හා සම්බන්ධ අදහස් පිළිබඳ අධ්‍යයනයක්

**නිරෝෂා සල්වතුර**[1]

හින්දී සාහිත්‍යයේ භක්ති යුගයෙහි එන ඥානමාර්ගී භක්ති සම්ප්‍රදායේ පුරෝගාමියා ලෙස සැලකෙන්නේ කබීර්දාස් ය. භක්ති යුගයට 'සන්ත්' සම්ප්‍රදාය දායාද වන්නේ කබීර්දාස්ගෙන් ය යන්න බොහෝ දෙනාගේ පිළිගැනීමයි. ඔහු කිසිවිටෙක ග්‍රන්ථකරණයෙහි යෙදුණු කෙනෙක් නො වේ, තම උපදේශාත්මක කාව්‍යයන් 'දෝහා' හෙවත් දෙපද කවිවලින් ඉදිරිපත් කළා පමණි. ඔහුගේ ශිෂ්‍යයන් විසින් එක්රැස් කරන ලද එම කාව්‍ය 'සාඛී' හෙවත් 'දෝහේ' නමින් ප්‍රචලිතය.

කබීර්දාස්ගේ භක්තිමය උපදේශ කාව්‍යයන්ගෙන් ඉදිරිපත් වන අදහස් බෞද්ධ දර්ශනයෙහි එන යම් යම් අදහස් සමඟ සමානකම් දක්වන්නේ ද යන්න පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ ය.

ප්‍රමුඛ පදඃ භක්ති යුගය, ඥාන්මාර්ගී භක්ති සම්ප්‍රදාය, සාඛී
**Title:** A Study of the Buddhist Philosophical Notions in Sakhi of Kabirdas
**Keywords:** Kabirdas, Buddhist Philosophy, Sakhi

[1] ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, පිටිපන, හෝමාගම
Email: nsal1204@gmail.com